Department Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය: -සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

සතිය- 16

12 ශ්‍රේණිය

සකස් කළේ - උමේෂා නාරායන
මිය,ර/ෆර්ගසන් උසස් විද්‍යාලය

නිපුණතාවය 06 - එදිනෙදා ජීවිතයේදී තොරතුරු සන්නිවේදනය සහ ප්‍රවේශය සඳහා අන්තර්ජාලය කාර්යක්ෂමව හා ඵලදායී අන්දමින් යොදාගනී.

නිපුණතා මට්ටම 6.1 - අන්තර්ජාලයේ නිර්මිතිය ගවේෂණය කරයි.

පරිගණක ජාලය පරිගණක සන්නිවේදනයට සහ සම්පත් බෙදා ගැනීම් පහසු කිරීම සඳහා එකට සම්බන්ධ කර ඇති පරිගණක පද්ධති දෙකක් හෝ ඊට වැඩි ගණනක් සහ ඒවාට සම්බන්ධ කර ඇති වෙනත් පරිගණක උපාංග පරිගණක ජාලයක් ලෙස හැඳින්වේ.

## ජාල ප්‍රරූප

සාමාන්‍යයෙන් පරිගණක ජාල ඒවායේ භූගෝලීය පදනම මත වර්ගීකරණය කළ හැක ඒවා නම්

1. PAN
2. LAN
3. WAN

### PAN

ආසන්න වශයෙන් මීටර් 10ක පමණ ඉතා කුඩා ප්‍රදේශයක ක්‍රියාත්මක වන රැහැන් රහිත ජාලයකි. මෙමගින් ජංගම දුරකථන, යතුරු පුවරු, කැමරා, ලැප්ටොප් ආදිය සම්බන්ධ කරයි

### LAN

භෞතික වශයෙන් සමීප ව ඇති ජාල ප්‍රදේශීය ජාල ලෙස හැඳින්වේ. උදාහරණයක් ලෙස එකම ගොඩනැගිල්ලක් තුල පිහිටි පරිගණක ජාලයක් දැක්විය හැකිය. පාසල් විශ්වවිද්‍යාල සහ වෙනත් සංවිධාන විසින් පුළුල් ලෙස LAN භාවිතා කරනු ලැබේ.

### WAN

පුළුල් පෙදෙස් ජාල යනු රට පුරා සහ ලෝක ව්‍යාප්තව පැතිර ඇති ජාල වේ. මෙම ජාලයන් සාපේක්ෂ වශයෙන් විශාල භූමි භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කරයි.

## ජාලයක සන්නිවේදන උපකරණ

### Modem

අංකික සංඥා ප්‍රතිසම සංඥා බවටත්, ප්‍රතිසම සංඥා සංඥාවක් අංකික සංඥා බවටත් පත් කිරීමට මෙය භාවිතා කරයි. මොඩමය මගින් ලාංකික පුද්ගල

පරිගණකවලට පවත්නා ලෝක ව්‍යාප්ත ප්‍රතිසම දුරකතන ජාලය හරහා සන්නිවේදනය කිරීමට ඉඩ සලසයි.

**Router**

එක් ජාලයකින් තවත් ජාලයක් තුළ ඇති ගමනාන්තයක් වෙත පණිවිඩ යැවීම හෝ යොමු කිරීමට මං හසුරුව භාවිතා කරයි.

**NIC**

ජාල අතුරුමුහුණත් කාඩ්පත පරිගණකය සහ ජාලය අතර දෘඩාංග අතුරු මුහුණත සපයයි

**Switch**

ප්‍රේරකයා සහ ග්‍රාහකයා සිට සෘජුව පණිවිඩ යැවීමේ දී දත්ත ගලායාම සම්බන්ධීකරණය කරන ප්‍රධාන උපාංගය ස්විචය වේ.

I. පරිගණක ජාලයක් යනු කුමක්ද?

II. ප්‍රධාන ජාල ප්‍රරූප 3කි. ඒ මොනවාද?

කෙටියෙන් විස්තර කරන්න.

III. පුළුල් ප්‍රදේශ ජාලයක් සඳහා උදාහරණයක් ලියන්න.

IV. පරිගණක ජාලයක් සකස් කිරීමට අවශ්‍ය උපාංග මොනවාද?

V. එක ජාලයක් තවත් පරිගණක ජාලයක් සමඟ සම්බන්ධ කිරීමට භාවිතා වන

උපාංගය කුමක්ද?

VI. ස්විචයේ කාර්යයභාරය කුමක්ද?